# වෘත්තීය ණය යෝජනා ක්‍රමය

PEOPLE'S BANK
Pride of the Nation

ජිවිතයේ ඉලක්ක හඹායන තරුණ වෘත්තිකයන් දිරිමත් කිරීම සඳහා People's Professional ණය යෝජනා ක්‍රමය හඳුන්වාදී තිබේ. මෙම ණය යෝජනා ක්‍රමය විශේෂයෙන් සැළසුම් කර ඇත්තේ නිවාස, වාහන හෝ වෙනත් පරිභෝජන කටයුත්තක් සඳහා මූල්‍ය පහසුකම් අපේක්ෂා කරන ස්ථාවර මාසික ආදායමක් ඇති වෘත්තිකයින් සඳහාය.

**විශේෂ ප්‍රතිලාභ**

- තරගකාරී පොලී අනුපාත
- අවම ලියකියවිලි
- මාර්ගගත ක්‍රමයට අයදුම් කිරීමේ පහසුකම

**යෝග්‍යතාව**

- වෘත්තීය ආයතනවල සාමාජිකයින්, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය නිලධාරීන් (විධායක ශ්‍රේණියේ ලුතිනන්වරුන් සහ/හෝ ඉහල ශ්‍රේණියේ නිලධාරීන් ) ශ්‍රී ලංකා පොලීසියේ සහකාර පොලිස් අධිකාරී සහ ඉහල ශ්‍රේණිවල නිලධාරීන්, රජයේ/අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විධායක ශ්‍රේණීන් හි ස්ථිර පදනමින් සේවය කරන පුද්ගලයින් සහ නීතිඥයින් මෙම පහසුකම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.
- ණයකරු වයස අවුරුදු 18-60 අතර ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- ණයකරුගේ අවශ්‍යතාවය බැංකුවට පිළිගත හැකි නීත්‍යානුකූල අවශ්‍යතාවයන් විය යුතුය.

**පොලී අනුපාතය**

මහජන බැංකුවේ වෙබ් අඩවිය www.peoplesbank.lk වෙබ් අඩවිය ඔස්සේ තොරතුරු ලබාගත හැක.

**ආපසු ගෙවීමේ කාලය**

උපරිම ආපසු ගෙවීමේ කාලය වසර 10 කි. (ණයකරුගේ විශ්‍රාම දිනය, ලබාදෙන සුරැකුම්වල ස්වභාවය යනාදී ණයමුදලට අදාල සියළු කරුණු පිළිබඳව සිදුකරන ක්‍රමවත් ඇගයීමකින් පසු ආපසු ගෙවීමේ කාලය තීරණය කරනු ලබයි. )

**ගාස්තු/කොමිස්,පොලී ආදිය**

- ස්ථාවර / විචල්‍ය හෝ ඒකාබද්ධ ස්ථාවර විචල්‍ය අනුපාත
- ක්‍රමික ආපසු නොගෙවීමකදී, මුල් මුදල සඳහා අයකරන දඩ පොලිය
- හිඟ වාරික සඳහා දඩ පොලිය
- නියමිත ලිපි ද්‍රව්‍ය ගාස්තු
- ගිවිසගත් කාලයට ප්‍රථම ණයමුදල ගෙවා අවසන් කිරීමකදී අයකරනු ලබන ණයමුදල කලින් පියවීමේ ගාසතු
- තක්සේරු ගාස්තු ( අදාල නම් පමණක්)
- නෛතික ගාස්තු ( අදාල නම් පමණක්)
- මුද්දර ගාස්තු ( අදාල නම් පමණක්)
- රක්ෂණ ගාස්තු ( අදාල නම් පමණක්)

**අයදුම් කිරීමේ ක්‍රමය**

- www.peoplesbank.lk වෙත පිවිස අන්තර් ජාලය හරහා අයදුම් කළහැක.
- නැතහොත් අයදුම්කරුගේ මාස 03 ක වැටුප් පතකා සමඟ ආසන්නතම ශාඛාව හෝ සේවා මධ්‍යස්ථානය විසිත්ත කිරීම මඟින් ණය අයදුම් කළහැක.

**නියමයන් සහ කොන්දේසි**

- ශ්‍රී ලංකා රුපියල් වලින් ණය පහසුකම් සළකා බැලිය යුතුය.
- අයදුම්කරුගේ මාසික වැටුප / ණය වාරිකය මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ගිණුමකට ප්‍රේෂණය කරන බවට සේවා යෝජක වෙතින් ලිඛිත තහවුරුව ලබාගත යුතුය.
- ණය තොරතුරු කාර්යාංශ වාර්තාවට අනුව, ණය අයදුම්කරු සහ ඇපකරුවන් ණය ගෙවීම පැහැර හරින්නන් නොවිය යුතුය.
- යෝජිත ණය වාරිකය සහ පවතින අඩුකිරීම්/ණය බැදීම් ඇතුළුව සම්පූර්ණ අඩු කිරීම් දළ වැටුපෙන් 60% ක් තුළ විය යුතුය.
- වැටුප් ලබන ණයකරුවන් සඳහා ණය පහසුකමේ ආපසු ගෙවීමේ කාලය විශ්‍රාම වයස දක්වා සළකා බැලිය යුතුය.

**පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය**

- ණයකරු හට info@peoplesbank.lk හරහා පැමිණිල්ල යොමු කළහැක.
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැක.
- අදාල ශාඛාව,ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ඇමතීම මඟින් පැමිණිල්ල ඉදිරිපත් කළ හැක.

**වැඩිදුර තොරතුරු**

- www.peoplesbank.lk වෙත පිවිසෙන්න
- ඇමතුම් මධ්‍යස්ථානය - 1961
- ප්‍රධාන කාර්යාලය - 0112481481